## වෘත්තීය සමිතිවල කාන්තා සහභාගීත්වය වර්ධනය කිරීම උදෙසා වන මණ්ඩප සාකච්ඡා

2018/07/02 දින වෘත්තීය සමිතිවල කාන්තා සහභාගීත්වය වර්ධනය කිරීම උදෙසා වන මණ්ඩප සාකච්ඡාව කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ 06 වන මහලේ ශ්‍රවනාගාරයේදි පවත්වන ලදි. වෘත්තීය සමිතිවල කාන්තා නියෝජනය ඉහල දැමීම සහා එම සමිතිවල තිරණගන්නා මට්ටම් සඳහා කාන්තා සමාජිකත්වය ඉහල දැමිම සඳහා ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මකවන ක්‍රියාකාරි මට්ටමේ පවතින වෘත්තිය සමිති නියෝජිතයින් මෙම මණ්ඩප සාකච්ජාව සඳහා සහභාගි කරගන්නා ලදි.

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ **අතිරේක ලේකම්**තුමියතේ ප්‍රධානත්වයෙන් ආරම්භ කරන ලද මෙම මණ්ඩප සාකච්ඡාව කාලින වශයෙන් වැදගත්වන ආකාරය එතුමිය විසින් පැහැදිලි කරන ලදි. මෙහිදී මාතෘකා 04 ක් ඔස්සේ මෙම සාකච්ඡාවේ දේශණයන් පවත්වන ලද අතර අවසානයේදී සාකච්ඡාවාරය පවත්වා විද්වත් අදහස් ලබා ගන්නා ලදි.

පළමු දේශණය - වෘත්තීය සමිතිවල වර්තමාන තත්වය හා එහි කාන්තා සාමාජිකත්වය කෙබඳු වේද? - සහකාර කොමසාරිස් , කම්කරු දෙපාර්තමේන්තුව . මෙහිදි වෘත්තිය සමිතිවල ඉතිහාසය එහි සමාජික සංඛ්‍යාව එහි ඇති ඇති අභියෝගතා සම්බන්ධයෙන් සාකච්ජා කරන ලදි.

දෙවන දේශනය - වෘත්තීය සමිතිවල කාන්තාවන්ගේ සමාජිකත්වය වැඩිකිරිම කළ හැක්කේ කේසේද - ලේකම් රාජ්‍ය එක්සත් හෙද සංගමයේ ලේකම් විසින් ඉදිරිපත් කරන ලදි

ලංකාවේ වැඩිම කාන්තා සමාජික සංඛ්‍යාවක් සමාජිකත්වය දරණ වෘත්තිය සමිතිය වන්නේ රාජ්‍ය එක්සත් හෙද සංගමයයි.එහි සමාජික සංඛ්‍යාව 30000ක් වන බවද පෙන්වා දෙන ලදි. ඇය විසින්

කාන්තාවන්ට තිබෙන ගැටළු නොබියව කතා කිරිමට හැකියාවක් තිබිය යුතු බයට ඇය විසින් පෙන්වාදෙන ලදි.

තුන්වන දේශනය වශයෙන් ශ්‍රියා අහංගමගේ - (ස්ත්‍රී සංසදය) මහත්මිය විසින් වෘත්තිය සමිතිවල කටයුතුවල නිරත විමේදි කාන්තාවන් මුහුන දෙන ගැටළු සහ අභියේග සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කලාය.

හතරවන දේශනය වශයෙන් වැවිලි අංශයේ - ලෝගේ ලෝගේෂ්වරී මිය විසින් පෙන්වා දෙනු ලැබුවේ වැවිලි අංශයේ වෘත්තිය සමිතිවල කාන්තාවන්ගේ ගැටළු හා එම ගැටළු වලට විසඳුම් කවරේද යන්න තම දේශනයෙන් ඉදිරිපත් කලාය.

රාජ්‍ය එක්සත් හෙද සංගමයේ සභාපති අසන පරිදි ජාතික කාන්තා කමිටුව විසින් කාන්තාවන් උදේසා කරනු ලබන සේවාවන් කුමක්ද යන්න අසන ලදි.මෙහිදි ජාතික කාන්තා කමිටුවේ ප්‍රධානතම කාර්ය භාරය වන්නේ මෙම මණ්ඩප සාකච්ජාවේ ඉදිරිපත් වන්නාවූ යෝජනාවන් රාජ්‍ය ප්‍රතිපත්ති වලට අන්තර්ග්‍රහනය කිරිම නීතිමය විෂමතාවයක් පවතින්නේ නම් එය සංශෝධනය කිරිම යන්නයි.

වතුකරයට සෞඛ්‍යය ක්ෂේත්‍රයේ දියුණුව සඳහා පවුල් සෞඛ්‍යය සේවය සඳහා mid wife අවම සුදුසුකම් යටතේ බඳවා ගනු ලැබුවද වර්ථමානය වන විට එම සේවය ලබා නොදෙන බවට පෙන්වා දෙන ලදි.

වතු ක්ෂෙත්‍රෙය් ජීවත්වෙන මිනිසුන් සඳහා ඉහල වෛද්‍ය සේවාවක් අවශ්‍ය වන බවට ලෝගේ ලෝගේෂ්වරි මහත්මිය ප්‍රකාශ කරනු ලබයි.

ක්‍රිෂ්ටිනා හෙද සොයුරිය ප්‍රකාශ කරන පරිදි කාන්තාවන් හා ළමයින් ලිංගික අපචාරයන්ට ලක්වන අතර ඔවුන් පොලිසියට ගිය පසු පැමිණිලි කිරිමට පොලිසිය පවසන්නේ රාත්‍රිකාලයේ පැමිණෙන ලෙසටයි.

එමගින් කාන්තාවන් ලිංගික හිංසාවට පත්වන බවයි.සිඩෝ ප්‍රතිපත්ති කොපමන සම්මත වුවත් එය ලාංකීය සමාජයේ පොලොව මතට පැමිනිය යුතු බවට ඇය ප්‍රකාශ කරනු ලබයි.

තැපැල් දෙපාර්තමේන්තුවේ නිදහස් සේවක සංගමයේ ලේකම් පවසන ආකාරයට ජාතික කාන්තා කමිටුවට සම්බන්ධ විමට ඇති හැකියාව කුමක්ද යන්න විමසා සිටි.වෘත්තිය සමිතියි යනු කඩාකප්පල් කාරි දෙයක් බවට සමාජයේ ඇති මතය දුරස් කිරිමට ඇති හැකියාව කුමක්ද යන්න විමසන ලදි.

ලංකාවේ අධ්‍යාපනය තුලට මෙම සංකල්පය ප්‍රයෝගිකව යොදා ගැනිමට හැකියාවක් ඇද්ද යන්න ජාතික කාන්තා කම්ටුවට ඇති හැකියාව කුමක්ද යන්න විමසන ලදි.

පාසල් පෙල පොතට මෙම වෘත්තිය සමිති විෂය මාලාවක් වශයෙන් යොදා ගැනිමට හැකියාව ඇත්නම් මෙම සංකල්පය සාර්ථකව යොදා ගැනිමට හැකිය.

ප්‍රතිපත්ති සම්ප්‍රදනය කරනු ලබන ආයතනයක් වශයෙන් වෘත්තිමය කාරනවාක් ලෙස සලකා වෘත්තිමය සමිති පාසල් අධ්‍යාපනය තුලට යොමු කිරිම තුලින් කාන්තාවන්ට නිසි පිලිගැනිමක් සමග වෘත්තිය සමිති වලට සම්බන්ධ වි ක්‍රියා කිරිමට හැකියාව ලැබේ.

සිඩෝ ප්‍රඥාප්තිය කාන්තාවන්ගේ අයිතියක් බවට පත්වි ඇතත් එයට නිත්‍යානුකූල අයිතියකි බවය පත් කර නොමැත.

කාන්තාවන්ට දේශපාලනයට 25% අයිතියක් ව්‍යවස්ථා සම්ප්‍රධනය අවශ්‍ය නොවන අතර එය කාන්තාවන්ට ලැබිය යුතු දෙයකි.

ඔරුගොඩවත්ත මහත්මිය ප්‍රකාශ කරනු ලැබුවේ සංවිධානය විම කේවල් කිරිම යන දේවල් සඳහා කාන්කාවන් නොයන අතර එහෙත් සියළුම දෙනා සංවිධානය විමෙන් මෙම වෘත්තිමය අයිතිවාසිකම් ලබා ගැනිමට හැකිය.

වෙළඳකලාපයේ කාන්තාවන්ගේ ශ්‍රමයට සරිලන වැටුපක් නොගෙවන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංගනය කරමින් හාමුපුත්තු විසින් නිතීය උල්ලංගනය කරමින් වැඩ ආවරණය කර ගනි.

අසාධාරණ කම්කරු නිති යටතේ වැඩ කිරිම සේවක සභාවක් මිස වෘත්තිය සමිති පිහිටුවිමට නොහැකිය.එම අයගේ වෘත්තිය සමිති සම්බන්ධයෙන් හාමුපුත්තු දරන ආකල්පය වන්නේ එය විප්ලව කාරි සංවිධානයක් බවයි.

වැවිලි අංශය මගින්ද අදහස් යෝජනා ඉදිරිපත් වුහ.

වැවිලි අංශයේ එකම ශ්‍රමයට වැටුප් ලබා දීමේදී විෂමතාවක් දක්නට ලැබේ. දෛනික වැටුප් ලබා දීමේදී කාන්තාවන්ට ලැබෙන්නේ පිරිමින්ට ලැබෙන වැටුපට වඩා අඩු වැටුපකි. එබැවින් එය නිවැරදි විය යුතු ය.

තේ, රබර් වගාවන් ඉවත් වී කටුපොල් වගාවන් ව්‍යාප්ත වීම තුළ කාන්තාවන්ට රැකියා අවස්ථා අහිමි වෙමින් පවතී. කටුපොල් කැඩීම දිගු රිටක් උපකාරයෙන් පිරිමින් සිදුකරන කාර්යයක් වන අතර එය කාන්තාවන්ට සිදු කළ නොහැකි වීම එයට හේතුවයි.

කාන්තාව යනු ලිවීමට පමණක් හැකියාව ඇති අයකු බව බහුතරයක් වෘත්තීය සමිතිවල කල්පනාව වේ. වාර්තා ලිවීම සහ ලිපි ලිවීම පමණක් පදනම් කරගනිමින් ලේකම් ධූරය පමණක් කාන්තාවන්ට හිමි වන අතර සභාපති ධූරය සහ අනෙකුත් ධූරයන් පිරිනැමීමේදී කාන්තාවන් නොසලකා හැරේ.

මේ වන විට නිදහස් වෙළඳ කලාප ආරම්භ කොට වසර 40කට අධික කාලයක් ගත වී ඇත. එහෙත් වෘත්තීය සමිති නායකයන් මේ දක්වා ම කාන්තාවන් ආමන්ත්‍රණය කිරීමේදී අවතක්සේරුවක් සහිතව ''ළමයෝ'' යන ආමන්ත්‍රණය යොදා ගනිති. මෙහිදී කාන්තාවගේ වයස පවා නොසලකා හැරේ. මෙයට හේතුව කාන්තාවන් යනු අධ්‍යාපන මට්ටමෙන් පහළ දෙවැනි පන්තියේ පුද්ගලයින් බවට ආකල්පයක් ඔවුන් තුළ ඇති බැවිනි.

වෘත්තීය සමිතියක ක්‍රියාකාරී මට්ටමේ කටයුතු කරන කාන්තාවන් ඔවුන්ගේ පවුල තුළින් ම අධෛර්යමත් කරනු ලැබේ. කාන්තාවන් යනු ළඳ බොළඳ තැනැත්තියන් බවත්, ඔවුන් දරුවන් හැදීම, ඉවුම් පිහුම් කටයුතු වැනි ගේ දොර කටයුතුවලට විනා වෘත්තීය සංගම් වැනි විප්ලවකාරී සංවිධානවල කටයුතු සඳහා නුසුදුසු බවත් සැලකීම එයට හේතු වේ.

වෘත්තීය සංගම්වල රැස්වීම් බොහෝ විට රාත්‍රී කාලයන්හිදී පුද්ගලික නිවාසවල පැවැත්වීමේ නැඹුරුවක් පවතී. බොහෝ විට පිරිමි සාමාජිකයින් මෙවැනි අවස්ථාවල බීමත්ව සිටිති' එබැවන් කාන්තාවන්ට මෙවැනි රැස්වීම

සඳහා සහභාගි වීමේදී අපහසුතාවයන්ට ලක් වීමට සිදු වේ. එබැවින් වෘත්තීය සංගම්වල රැස්වීම් උදය වරුවේ සියලුම දෙනාට සහභාගි විය හැකි ස්ථානයක පැවැත්වීම සුදුසු ය.

කාන්තාවන්ට වෘත්තීය සංගම් ක්‍රියාකාරිත්වය සම්බන්ධ දැනුමක් නැති බවට ආකල්පයක් පිරිමි සාමාජිකත්වය තුළ පවතී. එහෙත් කාන්තාවන් දැනුවත් කිරීමට උනන්දු වන්නේ නැත. කාන්තාවන්ගේ හැකියාවන් පිළිබඳව වටහා ගත හැක්කේ ඔවුනට නිලතලවල කටයුතු කිරීමට ඉඩකඩ සැලසීම තුළින් වුවත් එය සිදුවන්නේ ද නැත.

